# කොටි ගුවන් ප්‍රහාර

කොටි කටුනායක ගුවන් හමුදා කඳවුරට ගුවන් ප්‍රහාරයක් එල්ල කෙළේ කෙසේ ද? කුමක් සඳහා ද? ඔවුන් ඉන් බලාපොරොත්තුවන්නේ කුමක් ද? ගුවන්යානා පැමිණියේ කොහේ සිට ද? ආපසු ගියේ කොහාට ද? කොටින්ට කොළඹට ගුවන් ප්‍රහාරයක් එල්ල කළ හැකි ද? ආදී ප්‍රශ්න රාශියක් බොහෝ දෙනාගේ සිත්වලඇති බවට සැකයක් නැත. ඒ ආකාරයෙන් ම නොවුව ද ඇතැමුන්ට ඒ හා සමාන ප්‍රශ්න ඇතිවිය හැකි ය. අප කොටි ගුවන් ප්‍රහාරය අඩුවෙන් තක්සේරු කළ යුතු නො වෙයි. එමෙන් ම ඒ පිළිබඳ ව කලබලයට ද පත් නොවීය යුතු ය.

කොටින්ට ගුවන්යානා ඇති බව දැනගෙන දැන් බොහෝ කල් ගත වී ඇත. ඉරානමඩු ගුවන්පථය යම් ප්‍රමාණයකට හෝ විනාශ කළ බව හමුදා ප්‍රකාශකවරු අපට විටින් විට ප්‍රකාශ කළහ. එහෙත් කොටි ලංකාවෙන් ම අහසට නැගුණේ නම් ඉන් අදහස්වන්නේ ඔවුන් සතු යම් ගුවන්පථයක් හෝ පථ හෝ ඇති බව ය. කොටි යොදාගෙන ඇත්තේ ඉතාම සැහැල්ලු වර්ගයේ ගුවන්යානා යැයි කියැවෙයි. තරමක මුදලක් ඇති පුද්ගලයකුට වුව ද එවැනි ගුවන්යානායක් මිල දී ගතහැකි බැවින් කොටි එතරම් හාස්කමක් කර නැතැයි ඇතැමකුට කිව හැකි ය. එහි සත්‍යයක් නැතිවා නො වෙයි. එහෙත් රාත්‍රී කාලයෙහි අපේ ගුවන් හමුදාවෙහි පරීක්ෂාවලට වැලි ගසා යම් දුරක් ගමන්කිරීම අපට සෙල්ලමක් ලෙස සලකා අමතක කළ නො හැකි ය.

මේ ගුවන්යානා කොටින්ට ලැබුණේ කෙසේ ද යන්න ද ප්‍රශ්නයකි. සටන් විරාමයට මුවා වී කොටි ගුවන්යානයක කොටස් ලංකාවට ගෙනැවිත් ඒ එකතුකර ගුවන්යානයක් නිර්මාණය කරන්නට ඇතැයි බොහෝ දෙනා සිතති. ගුවන්යානයක් නොව රොකට්ටුවක් වුව ද නිරාමාණය කරන අන්දම අවශ්‍ය නම් අද අන්තර්ජාලය ඔස්සේ වුව ද දැනගත හැකි ය. ඒ සියල්ල ඇත්ත ය. එහෙත් එපමණකින් අපට කොටි ප්‍රහාරය සුළුවෙන් තැකිය හැකි නො වෙයි. අනෙක් අතට කොටින්ට කටුනායක ගුවන් තොටුපළට පහර දීමට නොහැකි වී යැයි කියමින් සිත සනසාගැනීමට ද අපට අවශ්‍ය නැත. කොටි ගුවන්යානා පැමිණ ඇත්තේ ගුවන් තොටුපළට අලාභහානි කිරීමට නොව ගුවන් හමුදා කඳවුරට සුළුවෙන් නමුත් ප්‍රහාරයක් එල්ලකිරීමට ය.

ගුවන්යානා ඉහළට නැංවුයේ ලංකාවේ ගුවන්පථයකින් නම් වහාම ඒ විනාශකිරීම ගුවන් හමුදාවට කළ හැකි විය යුතු ය.  ගුවන්පථයක් මහා වනයක් මැද තිබිය හැකි දැයි නොදනිමි. ගුවන්යානය අහසට නැංවීම සඳහා යම් ඉඩක් තිබිය යුතු ය. ඇතැම් විට ගුවන්පථය අසල කොටි සංවිධානය දැඩි නිරීක්ෂණයක යෙදෙනවා විය හැකි ය. ඒ අසලට ගුවන්යානයක් පැමිණියහොත් ඒ විනාශකිරීමට කොටි සූදානම් ව සිටින බැවින් ඒ අසලට යැමට ගුවන්යානයකට නො හැකි යැයි කිසිවකු කීමට ඉඩ ඇත. එසේ නම් ඒ නිරීක්ෂණය හා සූදානම කටුනායක ද පවත්වාගෙන යැමට ගුවන් හමුදාව සමත්විය යුතු ය. ඒ එසේ වූවා නම් ඔවුන් කොටි ගුවන්යානා දෙක විනාශකළ යුතුව තිබුණි.

මේ එකක්වත් සිදු වී නැත. කෙසේ වෙතත් කොටි ගුවන්යානා අහසට නැංවුයේ ලංකාවෙන් පිටදී නොවේ යැයි තවමත් නිශ්චිත ව කියා නොමැත. කොටි ගුවන්යානා පැමිණියේ (අහසට නැංවුයේ)  කොහේ සිට ද ආපසු ගියේ කොහාට ද ආදී කරුණු පිළිබඳ ව විධිමත් පූර්ණ පරීක්ෂණයක් කළයුතු වෙයි. කොටින්ට ආධාර දෙන රටවල් ඇති විට අප කිසිම කරුණක්  විය නොහැකි දෙයක් ලෙස සලකා නිසොල්මන්ව සිටිය නො යුතු ය. මෙහි දී කෙරෙන ලොකුම විහිළුව නම් කොටින්ට අහස්යානා ඇතැයි කියමින් ඒ අපට පමණක් නොව ඉන්දියාවටත් සෙසු ලෝකයටත් තර්ජනයක් යැයි පෙන්වා දෙමින් කොටි පරාජයකිරීමට වෙනත් රටවලින් ආධාර ඉල්ලා සිටීම ය.

ඉන්දියාව හා බටහිර රටවල් පාලනය කරනු ලබන්නේ කිසිවක් තේරුම්ගත නොහැකි පුද්ගලයන් විසින් නො වෙයි. කොටින්ට ගුවන්යානා සතුවීම ඒ රටවලට තර්ජනයක් නම් අප ඒ බව ඔවුන්ට කියන තුරු ඔවුන්ට දැනගත නො හැකි ද? දැන් අප ඒ බව කියා ඇති බැවින් කරුණු තේරුම්ගෙන ඔවුන් කොටි පරාජයකිරීමට අප හා එක්වේ යැයි බලාපොරොත්තු ඇතිකර ගත හැකි ද? කොටි ගුවන්යානා ලබාගත්තේ ම අඩුම තරමින් බටහිර රටවල ද ආධාරයෙනි. එහි මිළ කෙසේ වුව ද, ඒ ලංකාවට ගෙන ආවේ නම් එසේ ගෙන ඒමේ දී බටහිර රටවල්, විශේෂයෙන් ම නෝර්වේ තානාපති වරප්‍රසාද ඒ සඳහා යොදවාගත්තේ යැයි සිතීමට සාධක ඇත. අනෙක් අතට කටුනායකට පැමිණි

© Prof. Nalin De Silva

කොටි ගුවන්යානා ගුවන්ගත කෙරුණේ ලංකාවෙන් පිටත භූමියක හෝ නැවක හෝ නම් ඒ සඳහා නියත වශයෙන් ම, විශේෂයෙන් ම, බටහිර රටක ආධාර ලබාගත යුතු වෙයි.

කොටි ගුවන්යානා ගුවන්ගත කිරීම බටහිර රටවල් නොදැනුවත් ව සිදුවී යැයි සිතීමට නො හැකි ය. එබැවින් කොටින් සතුව ගුවන්යානා ඇති බවත් ඒ මුළු මහත් ලෝකයට ම තර්ජනයක් බවත් පවසා කොටි පරාජය කිරීමට අනෙක් රටවලින් ආධාර පැතීම හොරාගෙ අම්මාගෙන් පේන ඇසීමකි. දෙමළ ප්‍රශ්නය සම්බන්ධයෙන් තවදුරටත් බටහිර රටවල් හා ඉන්දියාව කෙරෙහි විශ්වාසය තැබීම මහත් අනුවණ ක්‍රියාවකි. කොටි පවත්වාගෙන යනු ලබන්නේ ම මේ රටවල් විසින් බව අප තවමත් නොපිළිගන්නේ අපේ සිතුම් පැතුම් හැසිරවෙන්නේ ඒ රටවල් විසින් වීම හේතුවෙනි. කොටි ගුවන් ප්‍රහාරය පිළිබඳ ව ඉන්දීය විදේශ ඇමති ශිව ශන්කර් මෙනන් පවසා ඇති දෙයින් ම ඒ පිළිබඳ ඔවුන්ගේ ආකල්පය දැනගත හැකි ය. ඔහු ගුවන් ප්‍රහාරය තවත් එක් සිද්ධියක් පමණක් ලෙස සලකමින් එයට ඉතා අඩු සැලකිල්ලක් දක්වා ඇත. ඔහු කියා ඇත්තේ එක් සිද්ධියක් පමණක් උලුප්පා නොදක්වා සියළු ප්‍රචණ්ඩකාරී ක්‍රියා නැවැත්වීමට කටයුතු කළයුතු බව ය. ඔහු කියන්නේ කුමක් දැයි පැහැදිලි ය. ඉන්දියාවට අවශ්‍යවන්නේ ආණ්ඩුව කොටින්ට එරෙහිව කරන මෙහෙයුම් නැවැත්වීම ය.

මේ අවස්ථාවේ දී කොටි ගුවන්යානා එවා ඇත්තේ කොටින්ට එරෙහිව කෙරෙන මෙහෙයුම් නැවැත්වීමට ආණ්ඩුවට බලකිරීමට ය. ඒ තර්ජනයක් හා ඊනියා ශක්තිය පෙන්වීමකි. කොටි ඒ කරන්නේ බටහිර රටවල හා ඉන්දියාවේ අනුමැතිය ඇතිව ය. අපට අපේ තකතීරු අධ්‍යාපනය විසින් ලබාදෙන බටහිර හා ඉන්දීය ගැති මනස වෙනස් නොකර මේ ප්‍රශ්නයට සාර්ථක ව මුහුණදිය හැකි නො වෙයි. අන් සියල්ලට පළමු මානසික ව ස්වාධීන විය යුතුවෙයි. අපේ ඉතිහාසයේ ස්වර්ණම යුගයේ දී, එනම් අනුරාධපුර යුගයේ මුල් භාගයෙහි දී අපි අදීන මනසක් සහිත වීමු. ඒ අදීන මනස නැතිකරගැනීමෙන් පසුව අප තවමත් නොනැඟී ඇත්නම් එයට හේතුව ඒ අදීන යුගයේ දී අපට ලැබුණු ගැම්ම (ගම්‍යතාව) තවමත් යම් ප්‍රමාණයකට හෝ පැවතීම ය.

කොටි ගුවන් ප්‍රහාරය හේතුකොටගෙන සිදු වූ හානිය පිළිබඳ විස්තර ටැමිල් නෙට් වෙබ් අඩවියෙන් ප්‍රචාරය කෙරෙයි. ඔවුන් එහි දී අතිශයොක්තියෙන් ප්‍රචාරක කටයුතු කරන බව පැහැදිලි ය. අපි ඒ විශ්වාස නොකරමු. එහෙත් ආණ්ඩුව ද කිසිවක් සැඟවිය යුතු නො වේ. ජනතාව වෙනත් ප්‍රවෘත්ති මූලාශ්‍ර කරා යැම වැළැක්විය හැක්කේ ආණ්ඩුවේ ප්‍රවෘත්ති මගින් කිසිවක් නොසැඟවෙන්නේ නම් ය. මෙහි දී අප මතක තබාගත යුත්තක් නම් කොටි ගුවන් ප්‍රහාරය බීබීසිය විසින් මහත් අභිරුචියකින් ප්‍රශංසාත්මක ව ප්‍රචාරය කෙරුණු බව ය. බීබීසියට අනුව මේ ප්‍රහාරය කොටි සංවිධානයේ නිර්මාණාත්මක ක්‍රියාවකි. දී කිරට බළල්ලුත් සාක්කි යැයි කියන්නේ මෙවැනි අවස්ථාවල දී ය.

කොටි පරාජයකිරීමට බටහිර රටවල හා ඉන්දියාවේ සහාය පැතීම නොකෙරෙන වෙදකමට කෝඳුරු තෙල් හත්පට්ටයක් සෙවීමකි. කොටි ගුවන් ප්‍රහාරය ඔවුන්ට තර්ජනයක් නොවන්නේ ඔවුන්ගේ අනුග්‍රහය එයට ලැබෙන බැවිනි. කොටි ගුවන් ශක්තිය තර්ජනයක් වන්නේ ලංකාවට හා ලංකාවට පමණකි. ඉන්දියාව හා බටහිර රටවල් මේ සියල්ල හරහා ඊනියා සාම සාකච්ඡා සඳහා ආණ්ඩුවට බල කරනු ඇත. ශ්‍රී ල නි පක්ෂයේ යෝජනා ඉක්මණින් ඉදිරිපත්කිරීමටත් ඒ ඔස්සේ උතුරු හා නැගෙනහිර පළාත් සිංහලයන්ට අහිමිකිරීමටත් මේ ප්‍රහාර උපයෝගී කරගනිමින් බල කෙරෙනු ඇත. පසුගිය දා ඊ පි ආර් එල් එෆ් (පද්මනාභ) කණ්ඩායමේ යෝජනා ඉදිරිපත්කෙරී තිබුණි. ඒ යෝජනා පිටුපස නොව ඉදිරියේ ම ඉන්දියාව ඇති බව පැහැදිලි ය. ඉන්දියාව බුදුන් වහන්සේ බුදු වූ දේශය ද සිදුහත් කුමරු උපන් දේශය ද වෙයි. එහෙත් ඒ අප උපන් දේශය නො වෙයි. මෙරට ඇත්තේ සිංහල බුද්ධාගමක් බවත් බුදුන් වහන්සේට අප තුළ ගෞරවයක් ඇති බවත් ඉන්දියාව බුදු දහම හෝ බෞද්ධ සංස්කෘතියක් හෝ රැක නොගත් බවත් අප අමතක නොකළ යුතු ය. බුදුන් වහන්සේ ඉන්දියාවේ බුදු වුවත් සිංහලයන් නොසිටින්නට අද වන විට බෞද්ධ සංස්කෘතියක් ලෝකයෙහි නොතිබෙන්නට ඉඩ තිබුණි. බටහිර ගැන කියන්නට දෙයක් නැත. මොවුන් ගැන විශ්වාසයක් නොතබා අද ආණ්ඩුව කළයුත්තේ ජනතාව ගැන විශ්වාසය තබමින් ජනතාවට ඇත්ත කියමින් අනාගතයේ දී පැණවිය හැකි ආර්ථික තහංචිවලට ද ජනතාව සූදානම් කරමින් කොටි සමූලඝාතනය කිරීමට වහාම පියවර ගැනීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva